# ව්‍යවසායකත්ව අධ්‍යයනය

①

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 11 ශ්‍රේණිය

## ව්‍යාපාර සැලැස්ම

(1) වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. "ඔබ සැලසුම් කිරීමට අසමත් වන්නේ නම් ඔබ අසමත්වීමට සැලසුම් කරන්නේය." ඉහත ප්‍රකාශයෙන් අදහස් වන්නේ,
   - I. අසාර්ථකවීමට සැලසුමක් අවශ්‍ය බවය.
   - II. සාර්ථකවීමට සැලසුමක් අනවශ්‍ය බවය.
   - III. සාර්ථකවීමට සැලසුමක් අවශ්‍ය බවය.
   - IV. අසාර්ථකවීමට සැලසුමක් අනවශ්‍ය බවය.

2. ව්‍යවසායකයාගේ ව්‍යාපාර අදහස සැබෑ ව්‍යාපාරයක් බවට පත් කර ක්‍රියාත්මක කිරීම සඳහා,
   - I. දැක්මක් තිබිය යුතු වේ.
   - II. අරමුණක් තිබිය යුතු වේ.
   - III. ව්‍යාපාර සැලැස්මක් තිබිය යුතු වේ.
   - IV. වැඩි ප්‍රාග්ධනයක් යෙදිය යුතු වේ.

3. සැලසුම් සෑම විටම,
   - I. අනාගතය හා සම්බන්ධ කරයි.
   - II. අතීත තොරතුරු දක්වයි.
   - III. වර්තමාන තත්ත්වය පැහැදිලි කරයි.
   - IV. තරඟකාරීත්වය පැහැදිලි කරයි.

4. ව්‍යාපාර සැලසුම්වලින් දැක්වෙන්නේ,
   - I. අතීත තොරතුරුය.
   - II. අපේක්ෂිත තොරතුරුය.
   - III. වර්තමාන තොරතුරුය.
   - IV. ඉහත කිසිවක් නොවේ.

5. ව්‍යාපාර සැලැස්මකින් දැක්වෙනුයේ,
   - I. ව්‍යාපාරයකින් ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණුය.
   - II. ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරන විවිධ කාර්යයන්ය.
   - III. බාහිර පරිසරය පිළිබඳ පුරෝකථනයකි.
   - IV. ව්‍යාපාරයක් ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා අපේක්ෂිත විවිධ කාර්යයන්ය.

6. ව්‍යාපාර සැලැස්මක් යනු,
   - I. ව්‍යාපාරයක් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු දැක්වෙන ලේඛනයකි.
   - II. ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විවිධ කාර්යයන් දැක්වෙන ලේඛනයකි.
   - III. ව්‍යාපාරයක් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා කාර්යයන් දැක්වෙන ලේඛනයකි.
   - IV. ව්‍යාපාරයක් විවිධ පරිසර වෙනස්කම්වලට අනුගත වන අයුරු දැක්වෙන ලේඛනයකි.



ව්‍යවසාය හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

LIVEWORKSHEETS

7. පාසල තුළ ක්‍රියාත්මක වන සැලසුමක් **නොවන්නේ,**

| | | | |
|---|---|---|---|
| I. | වාර්ෂික ලිතය. | II. | නිවාස ඉදිකිරීමේ සැලසුමය. |
| III. | පන්ති කාලසටහනය. | IV. | ගුරුවරුන්ගේ වාර සටහන්ය. |

8. ව්‍යාපාර සැලැස්මක මූලිකාංග,

| | | | |
|---|---|---|---|
| I. | දෙකකි. | II. | තුනකි. |
| III. | හතරකි. | IV. | පහකි. |

9. ව්‍යාපාර සැලැස්මක මූලිකාංග පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

I. අලෙවි සැලැස්ම, පරිපාලන සැලැස්ම, වෙළෙඳපොළ සැලැස්ම ය.

II. අලෙවි සැලැස්ම, වෙළෙඳපොළ විශ්ලේෂණය, විධායක සාරාංශය.

III. අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම, විධායක සැලැස්මය.

IV. අලෙවි සැලැස්ම, පරිපාලන සැලැස්ම, මූල්‍ය සැලැස්ම ය.

10. ව්‍යාපාර සැලැස්මක මූලිකාංගයක් වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | නිෂ්පාදන සැලැස්මය. | II. | වෙළෙඳපොළ සැලැස්මය. |
| III. | මුළු ආයෝජන ඇස්තමේන්තුවයි. | IV. | ඒකක පිරිවැයයි. |

11. ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලිකාංගයක් **නොවන්නේ,**

| | | | |
|---|---|---|---|
| I. | විධායක සාරාංශය ය. | II. | නිෂ්පාදන සැලැස්මය. |
| III. | පරිපාලන සැලැස්මය. | IV. | වෙළෙඳපොළ විශ්ලේෂණය ය. |

12. ව්‍යාපාර සැලැස්මක සංක්ෂිප්තය දැක්වෙනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | අලෙවි සැලැස්මේ ය. | II. | විධායක සාරාංශයේ ය. |
| III. | නිෂ්පාදන සැලැස්මේ ය. | IV. | මූල්‍ය සැලැස්මේ ය. |

13. ව්‍යාපාර සැලසුමක් පරිශීලනය කරන පුද්ගලයෙකුට ව්‍යාපාරයේ පවතින වැදගත්ම කරුණුවල එකතුවක් දැක්වෙන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | අලෙවි සැලැස්මේ ය. | II. | නිෂ්පාදන සැලැස්මේ ය. |
| III. | විධායක සාරාංශයේ ය. | IV. | මූල්‍ය සැලැස්මේ ය. |

14. ව්‍යාපාරය පිළිබඳ චිත්‍රයක් මනසේ නිර්මාණයවීමට සමත්වන පරිදි ඉදිරිපත් කළ යුත්තේ,

| | | | |
|---|---|---|---|
| I. | මූල්‍ය සැලැස්මේ ය. | II. | නිෂ්පාදන සැලැස්මේ ය. |
| III. | විධායක සාරාංශයේ ය. | IV. | මූල්‍ය සැලැස්මේ ය. |

15. ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. ව්‍යාපාර සඳහා මග පෙන්වීම කරනුයේ ව්‍යාපාර සැලැස්මයි.

B. ව්‍යාපාර අදහස පැහැදිලි කරනුයේ ව්‍යාපාර සැලැස්මයි.

C. ව්‍යාපාර පරිසරය පිළිබඳ අවබෝධ කර ගැනීමට ව්‍යාපාර සැලැස්ම අවශ්‍ය වේ.

D. ව්‍යාපාරවල ලාභය/ අලාභය තීරණය කිරීමට ව්‍යාපාර සැලැස්ම අවශ්‍ය වේ.

ඉහත ප්‍රකාශවලින් ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාව නිවැරදිව දැක්වෙන ප්‍රකාශ වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | A හා D ය. | II. | C හා D ය. |
| III. | B,C හා D ය. | IV. | A,B හා C ය. |



LIVEWORKSHEETS

16. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සැලැස්මක ඇතුළත් තොරතුරු හා එම තොරතුරු අයත් ව්‍යාපාර සැලසුම් මූලිකාංග වේ. ඒවා නිවැරදිව ගැලපූ පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | ව්‍යාපාරයට අවශ්‍ය මානව සම්පත | A. | මූල්‍ය සැලැස්ම |
| 2. | ව්‍යාපාරයේ ආයෝජන ඇස්තමේන්තුව | B. | විධායක සාරාංශය |
| 3. | ව්‍යාපාරයේ නම සහ කර්මාන්ත ක්ෂේත්‍රය | C. | අලෙවි සැලැස්ම |
| 4. | ව්‍යාපාරයේ විකුණුම් පුරෝකථනය | D. | පරිපාලන සැලැස්ම |

I. 1-A, 2- D,3- B, 4- C ය. II. 1-D, 2-A ,3- B, 4- C ය.
III. 1-B, 2- C,3- D, 4- A ය. IV. 1-D, 2- A,3- C, 4- B ය.

17. විධායක සාරාංශයේ ඇතුළත් තොරතුරක් නොවන්නේ,

I. ව්‍යාපාරයේ සුවිශේෂී භාවය ය. II. ව්‍යාපාරයේ නම ය.
III. පසුගිය වසරේ විකුණුම් ආදායමය. IV. කර්මාන්ත ක්ෂේත්‍රය ය.

18. විධායක සාරාංශයේ ඇතුළත් තොරතුරක් වන්නේ,

I. ව්‍යාපාරයේ නම II. අලෙවි සැලැස්ම
III. නිෂ්පාදන සැලැස්ම IV. පරිපාලන සැලැස්ම

19. අලෙවි කිරීමට අපේක්ෂිත නිෂ්පාදිතය, ඒ සඳහා ඇති ඉල්ලුම පුරෝකථනය කර දැක්වෙනුයේ,

I. විධායක සාරාංශයේ ය. II. මූල්‍ය සැලැස්මේ ය.
III. අලෙවි සැලැස්මේ ය. IV. නිෂ්පාදන සැලැස්මේ ය.

20. නිෂ්පාදන සැලසුමක ඇතුළත් තොරතුරක් වන්නේ,

I. විකුණුම් පුරෝකථනය යි. II. මුළු ආයෝජන ඇස්තමේන්තුවයි.
III. වෙළෙඳපොළ විශ්ලේෂණය යි. IV. ඒකක පිරිවැය යි.

21. ව්‍යාපාරයට අවශ්‍ය වන මානව සම්පත පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ,

I. මූල්‍ය සැලැස්මේ ය. II. අලෙවි සැලැස්මේ ය.
III. පරිපාලන සැලැස්මේ ය. IV. නිෂ්පාදන සැලැස්මේ ය.

22. මූල්‍ය සැලැස්මක ඇතුළත් තොරතුරක් **නොවන්නේ**,

I. අපේක්ෂිත මුදල් ගලා ඒම. II. නිෂ්පාදන පිරිවැයයි.
III. ආයෝජන ඇස්තමේන්තුව. IV. අපේක්ෂිත මුදල් ගලා යාම.

23. ව්‍යාපාරය සඳහා සැලැස්මක අවශ්‍යතාවය දැක්වෙනුයේ,

I. අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා II. ලාභය වර්ධනය කර ගැනීම සඳහා
III. පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම සඳහා IV. ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය කර ගැනීම සඳහා

24. ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාවක් **නොවන්නේ**,

I. ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට II. ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමට
III. ව්‍යාපාරයේ ලාභ/අලාභ තීරණය කිරීමට IV. ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වා දීමට

25. සැලැස්මක් නොමැති වීමෙන් ව්‍යාපාරයට මුහුණ පෑ හැකි ගැටළුවක් වන්නේ.

I. ව්‍යාපාර අදහස පැහැදිලි වීම. II. වෙළෙඳපොළ පිළිබඳ තක්සේරු කිරීම.
III. අවශ්‍ය සම්පත් හඳුනා ගැනීම. IV. අරමුදල් සම්පාදනයට බාධාවීම.



LIVEWORKSHEETS

(2) පහත අයිතමයන් අයත් වන්නේ ව්‍යාපාර සැලසුමේ කුමන මූලිකාංගයට ද යන්න දක්වන්න.

1. ව්‍යාපාරයේ නම ..........................................
2. ඉලක්කගත පාරිභෝගිකයන් ..........................................
3. නිෂ්පාදන ක්‍රියාවලිය ..........................................
4. ව්‍යාපාර ප්‍රතිඵල ගණනය කිරීම ..........................................
5. සේවක වැටුප් හා වේතන ..........................................
6. ද්‍රව්‍ය පිරිවැය හා ශ්‍රම පිරිවැය ..........................................
7. ව්‍යාපාරයේ සුවිශේෂී බව ..........................................
8. වෙළෙඳපොළ විශ්ලේෂණය ..........................................
9. මුළු ආයෝජන ඇස්තමේන්තුව ..........................................
10. ව්‍යාපාරයේ මුදල් ප්‍රමාණය ..........................................

**(3)** පහත ප්‍රකාශ නිවැරදි නම්(✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ සලකුණු කරන්න.

1. ඕනෑම අරමුණක් සාර්ථක කර ගැනීමට සැලසුමක් අවශ්‍ය වේ. ☐
2. සැලසුම්, ව්‍යාපාර පරිසර තත්ත්වය විමසා බලා පිළියෙල කළ යුතුය. ☐
3. සැලසුමක් සහිතව ආරම්භ කරන සෑම ව්‍යාපාරයක්ම සාර්ථක වේ. ☐
4. ව්‍යාපාරයක් සාර්ථක වන්නේ වැඩියෙන් මුදල් ආයෝජනය කිරීමෙන් පමණි. ☐
5. ව්‍යාපාරයේ අරමුණු ඉටු නොවුව හොත් ඒ සඳහා යෙදූ සම්පත් අපතේ යා හැකිය. ☐
6. නිවාස සැලසුමක් යනු පාසලේ දැකිය හැකි සැලසුමකට නිදසුනක් වේ. ☐
7. අපේක්ෂිත සේවකයන් පිළිබඳ තොරතුරු පරිපාලන සැලැස්මක ඇතුළත් වේ. ☐
8. ව්‍යාපාරයක අරමුදල් සම්පාදනය පිළිබඳ තොරතුරු නිෂ්පාදන සැලසුමේ දැක්වේ. ☐
9. ව්‍යාපාරයක විකිණීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවාව පිළිබඳ මූල්‍ය සැලැස්මේ ඇතුළත් වේ. ☐
10. ව්‍යාපාර සැලැස්මේ සමස්තය කෙටියෙන් දැක්වෙන්නේ විධායක සාරාංශයේය. ☐

**(4)** පහත හිස්තැන්වලට වඩාත් ගැලපෙන වචනය වරහන තුළින් තෝරා ලියන්න.

1. ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් පිළියෙල කිරීම ................................ ගේ මූලික කාර්යයකි.
2. ඕනෑම අරමුණක් සාර්ථක කර ගැනීමට .........................තිබීම අවශ්‍ය වේ.
3. ව්‍යාපාරය මඟින් ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඒ සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විවිධ කාර්යයන් සංවිධානය කර විධිමත් ලෙස පිළියෙල කරන ලේඛනය ................................ යි.
4. ව්‍යාපාර සැලැස්මක සංක්ෂිප්තය දැක්වෙනුයේ .................................යේය.
5. ව්‍යාපාරයේ සුවිශේෂී බව, කර්මාන්ත ක්ෂේත්‍රය ආදිය දැක්වෙන්නේ ..................................යේය.
6. අලෙවි කිරීමට අපේක්ෂිත නිෂ්පාදිතය, ඒ සඳහා ඇති ඉල්ලුම, අලෙවි උපාය මාර්ග ඇතුළත් වන්නේ .................. ය.
7. භාණ්ඩ හෝ සේවා නිපදවීම සඳහා වැයවන පිරිවැය ඇස්තමේන්තු කර දක්වන ලේඛනය ..................... සැලැස්මයි.
8. ව්‍යාපාරයට අවශ්‍ය වේ යැයි අපේක්ෂිත මානව සම්පත හා ඒ සඳහා වැයවන පිරිවැය ඇතුළත් වන්නේ ..................සැලැස්මේය.
9. ව්‍යාපාරයක අරමුදල් සම්පාදනය, යෙදවීම පිළිබඳව දැක්වෙන්නේ ................සැලැස්මේය.
10. ව්‍යාපාර පරිසරය පිළිබඳව අවබෝධ කර ගැනීමට .........................ක් අවශ්‍ය වේ.

(සැලසුමක්, විධායක සාරාංශය, අලෙවි සැලැස්මේ, පරිපාලන, සැලැස්ම, ව්‍යවසායකයෙකු, ව්‍යාපාර සැලැස්ම, විධායක සාරාංශය, නිෂ්පාදන, මූල්‍ය)



LIVEWORKSHEETS

**(5)** පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1. ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ව්‍යවසායකයාගේ මූලික කාර්යය නම් කරන්න.
2. ව්‍යාපාර සැලසුම්, ව්‍යාපාර පරිසර තත්ත්වය විමසා බලා පිළියෙල කළ යුත්තේ ඇයි?
3. ව්‍යාපාර සැලැස්මක ඇතුළත් විය යුතු මූලික කරුණු දෙක දක්වන්න.
4. ව්‍යාපාරයකට සැලසුමක් අවශ්‍යවීමට හේතු තුනක් දක්වන්න.
5. ව්‍යවසායකයෙකුට ව්‍යාපාර සැලැස්මක් අවශ්‍ය වන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
6. ව්‍යාපාර සැලැස්මක් නොමැතිවීමෙන් ව්‍යවසායකයෙකු මුහුණ දෙන ගැටළු හතරක් දක්වන්න.
7. ව්‍යාපාර සැලසුමක් යනු කුමක්ද?
8. ව්‍යාපාර සැලැස්මක සංයුතිය දක්වන්න.
9. ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලිකාංග දක්වන්න.
10. විධායක සාරාංශයක ඇති වැදගත්කම පැහැදිලි කරන්න.
11. විධායක සාරාංශයක ඇතුළත් කරුණු හතරක් නම් කරන්න.
12. අලෙවි සැලැස්මක ඇතුළත් කරුණු හතරක් දක්වන්න.
13. නිෂ්පාදන සැලැස්මක ඇතුළත් කරුණු හතරක් දක්වන්න.
14. පරිපාලන සැලැස්මක ඇතුළත් කරුණු හතරක් දක්වන්න.
15. මූල්‍ය සැලැස්මක ඇතුළත් කරුණු හතරක් දක්වන්න.
16. ව්‍යාපාර සැලැස්මක් අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා යොදාගත හැක්කේ කෙසේද?
17. "ඔබ සැලසුම් කිරීමට අසමත් වන්නේ නම් ඔබ අසමත් වීමට සැලසුම් කරන්නේය"
    ඉහත ප්‍රකාශයෙන් අදහස් කරන්නේ කුමක්ද?
18. පාසලක පවතින සැලසුම් සඳහා උදාහරණ දෙකක් දක්වන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව



LIVEWORKSHEETS